**ශ්‍රී ලංකා  නව නිපැයුම් කරුවන්ගේ කොමිසම - 2010**

-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1:1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම(ශ්‍රී.ලං.ගි.ප්‍ර.)

ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| ප්‍රමිතිය | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලං.ගි.ප්‍ර. 16 හා 42 | 2010 දෙසැම්බර් 31 දිනට ශ ලංකා නව නිපැයම්කරුවන්ගේ කොමිසමේ සේවකයන් 12 දෙනෙක් සේවය කළ අතර පාර්තෝෂික වෙන් කිරීම කර තිබුණේ සේවකයින් 10 දෙනෙක් සඳහා පමණි. |
| (ආ) ශ්‍රී ලං.ගි.ප්‍ර. 18 | සථාවර වත්කම් ක්ෂය කිරීමේදී පොත් අගය ශන්‍ය වූ එහෙත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් යලි ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලං.ගි.ප්‍ර. 24 | වත්කම් මිලදී ගැනීම සඳහා යොදාගන්නා ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදායමක් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. |

1:2:2 ගිණුම්කරණ අඩුපාඩු

කොමිසම නමින් ලියාපදිංචි කර තිබූ රු. මිලියන 6 ක් වූ මෝටර් රථයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1:2:3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව නොපයවන ලද අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,835,094 ක් වු අතර ඉන් අවුරුදු 03 ට වැඩි රු. 136,622 ශේෂයද, අවුරුදු 02 ට වැඩි රු. 2,063,622 ශේෂය ද අවුරුදු 01 ට වැඩි රු. 634,850 ක ශේෂ විය.

(ආ) කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවා තිබූ ආපස ලබාගත හැකි තැන්පත් මුදල වූ රු.125,000 ආපසු අයකරගෙන නොතිබුණි.

1:2:4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනත | |
| (i) 4(1) වගන්තිය | අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන කොමසාරිස්වරයෙකුගෙන් හා සහකාර කොමසාරිස්වරු දෙදෙනෙකුගෙන් කොමිසම සමන්විත විය යුතු වුවද මෙම තනතුරු තුනම පුරප්පාඩු වී තිබුණ. |
| (ii) II(ඌ) වගනතිය | නව නිපැයුම් පිළිබඳ තරඟවලින් තෝරා ගනුලබන ජයග්‍රාහකයින්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන “නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්” වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකා ජනතාව අතර නව නිපැයුම් කිරීම හා නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම සහ ඊට ධෛර්යදීම කළ යුතු වුවත් 2008,2009 සහ 2010 වර්ෂ සඳහා ජනාධිපති සම්මාන උළෙල පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2004 අගෝස්ත 31 දිනැති අංක 353 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල වාහන අපහරනයෙන් ලැබෙන ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු වුවත් වාහන අපහරනයෙන් ලැබුණු රු.1,036,000 ක මදල ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. |
| (ඇ) | 2008 දෙසැම්බර් 26 දිනැති අංක 433 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන කැදවිය යුතු වුවත් එම සංචිතයේ නොමැති ආයතනයකින් රු.1,562,000 ක් වටිනා භාණ්ඩ, කලා ලොවේ නව නිපැයුම් සම්මාන උළෙල සඳහා මිලදී ගෙන තිබුණි. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 9.3.1 ජේදය | රු.100,000 ට වඩා වැඩි රථ වාහන අළුත්වැඩියා වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් වාහන අළුත්වැඩියාව සඳහා දරන ලද රු.102,205 ක මුදල සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ඉ) | 2002 පෙබරවාරි 22 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිසම සතු වාහන 5 ක රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. |

(ඊ) රජයේ මුදල් රෙගුලාසි
------------------------

| | | |
|---|---|---|
| (i) | මු.රෙ. 155 | වර්ෂය තුල දී නිකුත් කරන ලද විගණන විමසුම් 11 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ii) | මු.රෙ. 757(2) | ආයතනයේ ස්ථාවර වත්කම් පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2:1 මූල්‍ය සමාලෝචනය

2:1:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.7,472,478 ක ඌනතාවයක් ව අතර ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපී ඌනතාවය රු.22,953,040 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 15,480,562 ක ඌනතාවයේ අඩුවීමක් දක්නට ලැබුණි. මෙම ඌනතාවය අඩුවීමට හේතුවී තිබුනේ නව නිපැයුම්කරුවන්ට දිරි දීමනා ගෙවීම සඳහා වියදම, රු. මිලියන 17.9 කින් අඩුවීමත් වාහන අලෙවියෙන් රු. මිලියන 1 ක් උපයාගැනීමත් වේ.

2:2 මෙහෙයුම් සමාලෝචනය

2:2:1 භෞතික කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාර සැලැස්මේ සඳහන්ව තිබූ පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

| | ක්‍රියාකාර සැලැස්ම අනුව අපේක්ෂිත කාර්යය | 2010.12.31 දිනට ප්‍රගති වාර්තා අනුව ලභාකරගෙන ඇති ප්‍රතිඵල |
|---|---|---|
| i. | රටේ ආර්ථික වර්ධනය ඇති කර ගැනීම සඳහා නිර්මාණාත්මක පුරවැසියන්ගේ දායකත්වය ලබා ගැනීම | කාර්යය ඉටුකර නැත. |
| ii. | පාසැල් නව නිපැයුම් කව පිහිටවීම | අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් මගින් දැනුවත් කිරීම් පමණක් සිදුකර ඇත. පසු විපරමක් සිදුකර නොමැත. |
| iii. | කාර්මික විද්‍යාලවල නව නිපැයුම් කව පිහිටුවා අන්තර් කාර්මික විද්‍යාල තරඟ හා දැනුවත් කිරීම් පැවැත්වීම. | කාර්මික විද්‍යාල එකතුකර එක් වැඩසටහනක් පවත්වා ඇත. |
| iv. | විශ්ව විද්‍යාල වල නව නිපැයුම් කව ස්ථාපිත කිරීම | ඉටුකර නැත. |
| v. | නව නිපැයුම් තුළින් ජාතිය නගා සිටුවීම | " කලා ලොවේ නව නිපැයුම් කිරුළ " නම් ත්‍යාග ප්‍රදානෝත්සවය පමණක් පවත්වා තිබුණි. |

| | | |
|---|---|---|
| vi. | නව නිපැයුම් ප්‍රදර්ශන සහ අලෙවි මධ්‍යස්ථානය | ඉදිකර නොතිබුණි. |
| vii. | විද්‍යාත්මක නව නිපැයුම් හා ගවේශනයන් | එක් ව්‍යාපෘතියක් සිදුකර ඇත. |
| viii. | ජනාධිපති සම්මාන උළෙලක් පැවැත්වීම | උළෙල පවත්වා නොතිබුණි. |
| ix. | නව නිපයුම් සඳහා වන ජාතික ප්‍රදර්ශනය | පවත්වා නැත. |
| x. | දිවයින පුරා දිස්ත්‍රික් 22 ක් ආවරණයවන පරිදි නිර්මාණාත්මක සංගම් පිහිටු වීම | කළුතර දිස්ත්‍රික්කයේ පමණක් පවත්වා ඇත. |
| xi. | අන්තර් ජාතික නව නිපැයම් සඳහා ප්‍රදර්ශන හා තරඟ ජිනීවාහි අප්‍රේල් මාසයේදීද සෝල් නුවර දෙසැම්බර් මාසයේදීද පැවැත්වීම | පවත්වා නොතිබුණි. |
| xii. | ජාත්‍යන්තර සම්මන්ත්‍රන හා වැඩ මුළු සඳහා සහභාගී වීම | සහභාගී වී නොතිබුණි. |
| xiii. | හම්බන්තොට හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල නව නිපැයුම් මධ්‍යස්ථාන පිහිටුවීම. | පිහිටුවා නැත. |
| xiv. | අවසන් අදියරේ නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යාධාර සැපයීම | එක් නව නිපැයුම්කරුවෙකු සඳහා රු.75,000 ක මූල්‍යාධාරයක් ලබා දී ඇත. |
| xv. | කොමිසමේ නිලධාරීන් පුහුණු කිරීම | එක් නිලධාරියෙකුට පමණක් පුහුණුව ලබාදී ඇත. |

2:2:2 අවිධිමත් ගනුදෙනු
--------------------

(අ) නව නිපැයුම්කරුවකුගේ නිර්මාණ ඔහුගේ අවසරයකින් තොරව, වෙනස් කිරීම, සිදුනොකළ යුතු වුවත් 2009 වර්ෂයේදී නම වෙනස් කල දර්ශන අඩංගු බැනරයක් විදේශ රටක පැවති ප්‍රදර්ශනයකදී ප්‍රදර්ශනය කර තිබුණි.

(ආ) පර්යේෂණ මධ්‍යස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීමට 2009 සැප්තැම්බර් සිට බත්තරමුල්ල ප්‍රදේශයෙන් කුලියට ගත් තෙමහල් නිවසේ මහල් දෙකක් කොමසාරිස්වරයාගේ නිල නිවස වශයෙන් යොදා ගෙන තිබූ අතර අයකිරීම් කිසිවක් කර නොතිබුණි.

2:2:3 කළමණාකරණ අකාර්යක්ෂමතා
----------------------------------
1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ දිරිගැන්වීමේ පනතේ 11(1) වගන්තිය අනුව කොමිසම විසින් ඉටුකළ යුතු පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(අ) පේටන්ට් බලපත්‍ර ලබාදීමට සුදුසු නව නිපැයුම් තෝරා පේටන්ට් බලපත්‍ර ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයකදී ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ බුද්ධිමය දේපල අයිතීන් උල්ලංඝනය වන විටදී ඔවුන්ගේ බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා නීතිමය සහාය ලබාදීම.

(ඇ) පේටන්ට් බලපත්‍රය ඇපයට ගෙන රාජ්‍ය හෝ වෙනත් ආයතන වලින් ණය ලබාදීමට හැකිවන පරිදි වාණිජමය වටිනාකමකින් යුත් නව නිපැයුම් නිර්දේශ කිරීම.

(ඈ) දේශීය හා විදේශීය වෙළඳ පොළ පහසුකම් සොයා ගැනීමට උපකාර කිරීම.

(ඉ) නව නිපැයුම් සඳහා පර්යේෂණ සිදුකිරීමට හැකිවන පරිදි සැමට විවෘත පර්යේෂණාගාරයක් ආරම්භ කිරීම.

(ඊ) නව නිපැයුම් පුවත් සඟරාව මුද්‍රණය කිරීම හා රූපවාහිනී, ගුවන් විදුලි වැඩසටහන් හා අනෙකුත් මාධ්‍ය වැඩසටහන් මගින් නව නිපයුම්කරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

(උ) නව නිපැයුම් වාණිජකරණය කිරීම.
මෙම කාලය තුළ හිටපු කොමසාරිස්වරයාගේ ක්‍රියාකලාපය නිසා පරිපාලනමය කටයුතු අක්‍රිය වූ අතර එම නිසා ප්‍රශස්ථ මට්ටමෙන් කොමිසමේ කටයුතු ඉටුවී නොමැති බව වැඩ බලන ලේකම්වරිය දැනුම් දී ඇත.

2:2:4 ආර්ථික නොවන ගනුදෙනු
----------------------------
විද්‍යාත්මක නව නිපැයුම් මධ්‍යස්ථානය
----------------------------------------
හිටපු කොමසාරිස් වරයාගේ අභිමතය පරිදි කොමිසම විසින් විද්‍යාත්මක නව නිපැයුම් මධ්‍යස්ථානයක් බත්තරමුල්ල ප්‍රදේශයේ කුලී ගොඩනැගිල්ලක පිහිටුවා තිබූ අතර, ඒ සඳහා මසකට රු.125,000 බැගින් කුලී ගෙවා තිබුණි. 2009 සැප්තැම්බර් 01 දින සිට 2010 අගෝස්තු දක්වා ගොඩනැගිලි කුලී, විදුලිය, ජලය හා දුරකථන වියදම් ලෙස රු.2,242,797 ක් දරා තිබුණි. එහි කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබූ අතර 2010 අගොස්තු මාසයෙන් පසුව මෙම මධ්‍යස්ථානය වසා දමා තිබුණි. මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු ඉටු නොවීම හා ඒ සඳහා වැය කල මුදල ආර්ථික නොවන වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

2:2:5 මානව සම්පත් කළමණාකරණය

------------------------------------

කොමිසමේ සංවිධාන සටහන අනුව කාර්ය මණ්ඩලය 23 ක් වුවද නිලධාරින් 10 ක පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර නොතිබුණි.

2:2:6 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම

--------------------------------------------

කොමිසම විසින් සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සංශෝධනය කර නොතිබුණි. 2008 / 2012 කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කිරීමෙන් පසු වාර්ෂිකව සංශෝධනය කර නොතිබුණි.

2:2:7 ඌන උපයෝජිත වත්කම්

-------------------------

(අ) ගිණුම් අංක 033100121791065 දරන බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂය රු.3,184,502 ක් වූ අතර 2010 මැයි මස සිට ගිණුම අක්‍රියව පැවතුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට නව නිපැයුම්කරුවන්ගේ අරමුදලේ ශේෂය රු.2,502,375 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී නව නිපැයුම්කරුවන සඳහා කිසිදු ණය මුදලක් ලබාදී නොතිබුණි.

(ඇ) කොමිසම සතුව වාහන 5 ක සංචිතයක් පැවතියද ඉන් වාහන තුනක්ම ධාවනය කළ නොහැකිව නිශ්කාර්යව පැවතුණි.

2.2.8 අභ්‍යන්තර විගණනය

----------------------

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිසමේ කොමසාරිස් වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) කාර්ය සාධනය
(ඉ) පරිපාලනය